# 16 පාඩම

## නොකර පව්කම් කරමු පින්කම්

- ❖ බුද්ධ දේශනාවට අනුව කර්මය යනු චේතනාවයි.
- ❖ චේතනාහං භික්ඛවේ කම්මං වදාමි, චේතයිත්වා කම්මං කරෝති කායේන, වාචාය, මනසා (මහණෙනි, මම චේතනාව කර්මය යැයි කියමි. සිතින් සිතා කයින්, වචනෙන් හා මනසින් කරන ක්‍රියා කර්ම)
- ❖ චේතනාව අනුව කර්මය දෙයාකාර ය.

1. කුසල කර්ම
2. අකුසල කර්ම

- ❖ දස කුසල්, ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියා ආදිය කුසල් ගණයට ද දස අකුසල්, පස් පව් අකුසල් ගණයට ද අයත් ය.
- ❖ නැවත නැවත ඉපදීම කෙරෙහි බලපාන්නේ අප සිදුකරන කුසලාකුසල කර්මයන් ය.
- ❖ අප සිදුකරන නරක ක්‍රියා ගැලක පසුපස එන රෝදය මෙන් අප පසු පසම එයි.

W.M.V.

❖ එමෙන් ම අප කරන යහපත් ක්‍රියා අප අත් නොහැර එන සෙවනැල්ල මෙන් අප සමඟ ම එයි.

❖ සැප විපාක ලැබෙන විට සිතට සොම්නසක් දැනෙන ක්‍රියා කළ යුතු වේ.

❖ පෙර කරන ලද කර්මවල විපාක බුදුන් වහන්සේට මෙන්ම මහරහතන් වහන්සේලාටත් අත් විඳි බව සඳහන් වේ. එහෙයින් අප අකුසල ක්‍රියා නොකර කුසල ක්‍රියා කිරීමට අදිටන් කර ගනිමු.

○ ප්‍රශ්න

1. බුදුන් දවස ආනන්තරීය පාප කර්මයක් කළ රජු කවුද?
2. රජගහනුවර වාසය කළ ශාස්තෘන් 6 දෙනා කවුරුන්ද?
3. කර්මය යනු කෙටියෙන් හඳුන්වන්න.
4. කර්මයේ ප්‍රධාන කොටස් 2ක කුමක්ද?
5. ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියා මොනවාද?
6. බුදුන් වහන්සේ තොදෙයා පුත්‍ර සුභ මානවකයාට දේශනා කළ කර්මයේ ස්වභාවය පැහැදිලි කරන්න.

W.M.M.V.

7. බුදුන් වහන්සේට විපාක දුන් අකුසල කර්ම 2ක් ලියන්න.

8. මුගලන් මහරහතන් වහන්සේට සොරුන් ගෙන් පහර කෑමට සිදු වූ ආකාරය පැහැදිලි කරන්න.

W.M.M.V.